

## මට ආසයි එදා වගේ

මට ආසයි හනි හනිකට
අතීතයට දුවල යන්න
කුඹුරට ගොස් ලන්ද උඩින්
හඳ පායන හැටි බලන්න

පාසල් නැති නිවාඩුවට
මිතුරන් සැම එකතු වෙලා
කුඹුරේ වක්කඩට ගොසින්
පීනන මාළුන් බලන්න

මට ආසයි හනි හනිකට
අතීතයට දුවල යන්න
හෝඩි පොතේ පිටු පෙරළා
'අ' යන්න හයියෙන් කියන්න

කදුරු බෝල එකතු කරල
පොල්පිති ගෙන විකට් හදල
හඳපානේ පිල් බෙදිලා
ක්‍රිකට් ගසා සතුටුවෙන්න

කිරි බැබලෙන හඳපානේ
හඳ මාමට කවි කියන්න
කිරිත් පැණිත් ගෙනෙනා තුරු
බලමින් උඩ පැන නටන්න

පසළොස්වක පෝයදාට
සුදු ඇඳගෙන මල් අරගෙන
පවුලේ සැම එකතුවෙලා
හවසට පන්සලට යන්න

දුරුතු මහේ පුන් පෝයට
නෑදෑ සැම එකතුවෙලා
පීතර මාමගෙ ලොරියෙන්
කැළණි ගොසින් වැඳල එන්න

*ආචාර්ය ෂෙල්ටන් පීරිස්*

THE SINHALA - P. 34
December 2012
Published - The Sinhalese Cultural Forum of NSW
ISSN: 1834-7061